# නිදහසින් පසු ගොවි ආර්ථිකය සහ වර්තමාන ගොවීන් මුහුණදෙන අභියෝග

**2010 පෙබරවාරි මස 24 දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී පැවති ගොවි සම්මේලනය ඇසුරිනි.**

දුරාතීතයේ පෙරදිග ධාන්‍යාගාරය නමින් මුළු මහත් ලෝකයේ ම අවධානයට පාත්‍ර වූ, හෙළ රජ සමයේ බතින් බුලතින් ආඩ්‍යව පැවති ලක් මවට පරසතුරු ආක්‍රමණයන් සමග මුහුණපාන්නට සිදුවූයේ බරපතල ඛේදවාචකයකට ය. එදා ලොවට බත සැපයූ, කෘෂිකර්මය සිය ප්‍රධාන ජීවනෝපාය ලෙස ගෙන යමින්, එතෙරට අත නොපෑ ජාතියක්, නිවට වහල් දීන ජාතියක් බවට පත්වූයේ 1815 මුළු ලක්දිව ම ඉංග්‍රීසි යටත් විජිතයක් ව, ඔවුන්ගේ වැවිලි ආර්ථිකයට හුරුවන්නට සිදුවූ නිසා ය. මෙහි දී ඉංග්‍රීසීන් වැවිලි ආර්ථිකයට වැඩි වාසි අත්වන ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර, 1915 දී ඇතිවූ පළමු ලෝක සංග්‍රාමයත් සමග මෙම ප්‍රතිපත්තිය හදිසියේ ම වෙනස් වී වියළි කලාපයේ පැරණි වාරිමාර්ග ක්‍රම ප්‍රතිසංස්කරණය කොට ආහාර ද්‍රව්‍ය අතින් ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත කිරීමේ අගය අවධාරණය කෙරිණි. විදේශ අධිපත්‍යයෙන් 1948 නාමික වශයෙන් මිදුණ නමුත් සමාජීය වශයෙන් මෙරටෙ හි ගමන් මග කිසිදු ඉලක්කයක් නොමැති මංමුලාවූවක් සේ පෙනේ. එබැවින් ක්‍රමක්‍රමයෙන් ආහාර ද්‍රව්‍ය ආනයනය වැඩිවූ අතර, කෘෂිකර්මයේ නියැළි ජන කොටස සමාජ ආර්ථිකයේ වැදගැම්මකට නැති කොටසක් ලෙස සැලකීමේ පුරුද්දක් ඇති විය (පනස් වසරක අත්දැකීම් තුළින් නව කෘෂිකර්මයක් වෙත, 1998). මේ අතර 1931--1953 කාලය තුළ වියළි කලාපයේ ගොවි ජනපද පිහිටුවීමේ වැඩපිළිවෙළ සීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. 1957 දී ගොවිජන සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඉතා වැදගත් මංසලකුණක් වශයෙන් සැලකිය හැක. 1965 කාලයේ දී ග්‍රාමීය කෘෂිකර්මය වර්ධනය සඳහා රජයේ ඉහළ අවධානය යොමු විය. මේ වන විට ලංකාවේ ආර්ථිකය කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන අංශවලින් සමන්විත වූ අතර භෝග, ධීවර, පශු සම්පත් හා වන සම්පත් අංශවලින් කෘෂිකාර්මික ක්ෂේත්‍රය සමන්විත විය. මේ අතරින් ප්‍රධාන වූ භෝග අංශය වැවිලි හා වැවිලි නො වන අංශ දෙකෙන් සමන්විත වූ අතර ශ්‍රී ලංකාවේ ගොවි ආර්ථිකය ලෙස සැලකෙන්නේ වැවිලි නො වන අංශය යි. කෙසේ වෙතත් ආර්ථික දියුණුවත් සමග ඕනෑම රටක කෘෂිකාර්මික අංශයට හිමිවන්නේ පහළ වර්ධන අගයකි. ප්‍රධාන වශයෙන් ස්වභාවධර්ම සාධක මත රඳා පවතින ගොවි ආර්ථිකය තුළ නිෂ්පාදනය විචලනය වීමේ අවධානම වැඩි ය. කෘෂිකාර්මික භාණ්ඩවල ඇති ඉක්මනින් නරක් වන සුළු බව, නිෂ්පාදන සාධක යෙදවීම හා ප්‍රතිලාභ ලැබීම අතර කාල ප්‍රමාදයක් තිබීම, ඉල්ලුමට අනුව සැපයුම සීමා කිරීමට නො හැකිවී ම හා ඉල්ලුම අනම්‍ය වීම ගොවි ආර්ථිකයක ප්‍රධාන ලක්ෂණ වේ. 1970 දී 10.2% ක් වූ වැවිලි නො වන භෝග අංශයේ වර්ධන වේගය 2000 වන විට -1.0% දක්වා පහළ බැස තිබූ අතර 2008 වන විට නැවතත් 8.3% දක්වා වාර්තාගත වර්ධන වේගයක් පෙන්වා තිබේ (ශ්‍රී ලංකා මහ බැංකුව). වැවිලි නො වන භෝග යටතේ ප්‍රධාන වශයෙන් අවධානයට ලක්වන වී වගාව සඳහා වූ බිම් ප්‍රමාණය 1970 හෙක්ටයාර් දශලක්ෂ 570 ක් වූ අතර 2008 වන විට හෙක්ටයාර් දශලක්ෂ 717 ක් දක්වා 19% කින් වර්ධනය වී තිබේ.

වැඩවසම් යුගයේ ලක්ෂණයක් ලෙස ඉඩම් හිමි ගොවීන් හා ඉඩම් අහිමි අඳ ගොවීන් වශයෙන් ගොවීන් ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත පංති 2ක් නිර්මාණය වූ අතර අඳ ගොවි ප්‍රශ්නය විසඳීම සඳහා 1958 කුඹුරු පනත සම්මත කරන ලදී, 1949 ජන ලේඛනයට අනුව එවකට අඳ ගොවි ක්‍රමය යටතේ පැවති මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 2,12,151 ක් වූ අතර 1962 වන විට එම ප්‍රමාණය අක්කර 2,80,272 දක්වා වර්ධනය වී තිබුණි. මින් පසු 1979 අංක 58 දරන ගොවි ජන සේවා පනත ද ක්‍රියාත්මක වූ අතර 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත නිර්මාණය වීමත් සමග අඳ ගොවියා කබලෙන් ලිපට වැටුණු තත්ත්වයක් උදා විය. එසේ ම 2000 ගොවිජන සංවර්ධන පනතින් පිහිටුවන ලද ගොවිජන සංවර්ධන සභාව මේ වන විට අකාර්යක්ෂම වී තිබේ. ගොවි නියෝජිතයින්ට අනුව මෙම ගොවිජන සංවර්ධන

පනත ගොවි ජනතාවගේ අවශ්‍යතාවන් හා ඔවුන්ගේ අදහස් නො සලකා හැර සාදන ලද එකක් නිසා මේ වන විට ගොවීන් අසරණ වී තිබේ. නිලධාරීන්ගේ සහයෝගය මදකම, ගොවි සංවිධානවලට ස්වාධීනව ක්‍රියාත්මක වීමට අවස්ථාව ලබා නො දීම එහි ඇති ප්‍රධාන දුර්වලතාවයක් ලෙස ගොවීහු සලකති. 2000 පනත මගින් ගොවිජන සභාවක් පිහිටුවීමට යෝජනා කර තිබුණ ද මේ දක්වා එය පත් නො කිරීම නිසා ගොවීන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත නොවී පවතී. ගොවි සංවිධාන 14,000ක් පමණ මේ වන විට ලංකාව පුරා ක්‍රියාත්මක වුව ද මින් සමහරක් නාමිකව පමණක් දක්නට ලැබේ. ගොවි සංවිධානවල ඒකාබද්ධ ප්‍රවේශයක් නො තිබීමත්, වරින්වර ගන්නා රාජ්‍ය ප්‍රතිපත්ති නිසාත් ගොවීන්ට ගැටළු සහගත තත්ත්වයකට මුහුණදීමට සිදුව පවතී. නීති පැවතිය ද ඒවා නිසියාකාරව ක්‍රියාත්මක නො වන තත්ත්වයක් තුළ ගොවි සංවිධානවල නිලධාරීන් සහ ගොවීන් අතර දුරස්ථභාවයක් දක්නට ලැබීම නිසා අසරණ ගොවීන් තව තවත් පීඩාවට පත්වේ. මේ වන විට ගොවීන් ගොවි සංවිධාන වටා එක් රැස් වී සිටිනුයේ තම කුඹුරුවලට ලබා ගත යුතු සහනාධාර පොහොර ලබා ගැනීම සඳහා ය. ඒ ඇරෙන්නට ගොවීන්ට තමන්ගේ කුඹුරට යෙදිය යුතු කෘමිනාශක, වල් නාශක පිළිබඳ නිවැරදි අවබෝධයක් නැත. තම වගාවකට කෘමිනාශක යෙදීමට අවශ්‍ය වූ විට ගොවීන් කරනුයේ පෞද්ගලික වෙළඳුන්ගෙන් විමසා ඔවුන් නිර්දේශ කරන කෘමි නාශකයක් භාවිතා කිරීම යි. කෙසේ වුව ද, ඇතැම් ප්‍රදේශවල ගොවීන් කෘමි නාශක භාවිතයෙන් ඉවත්ව සමෝධානික පළිබෝධ පාලනයට හුරු වී ඇති අතර, මෙය තවදුරටත් දිරි ගැන්විය යුතු ය. නිර්දේශ ප්‍රමාණයට වඩා රසායනික පොහොර අධිකව භාවිතා කිරීම බහුලව දක්නට ලැබෙන අතර මේ නිසා පසේ සාරවත් බව අඩු වී ඵලදායීතාවය හීන වේ. එසේ ම රසායනික පොහොර භාවිතයට අධික පිරිවැයක් දැරීමට ද රජයට සිදුවේ. එම නිසා කාබනික පොහොර භාවිතයට නැඹුරු වීම වැදගත් වේ. දැනටමත් ඇතැම් ප්‍රදේශවල ගොවි මහතුන් මේ සඳහා යොමු වී තිබීම හොඳ ප්‍රවණතාවයකි. කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රචලිත කිරීම සඳහා ගොවීන් දිරි ගැන්වීමත්, කාබනික පොහොර නිෂ්පාදනයට අධිකාරියක් පිහිටුවීමත් මේ සම්බන්ධයෙන් රාජ්‍ය මැදිහත්වීම පෙන්නුම් කරයි. නමුත් පිදුරු ආදිය කුඹුරට යෙදීමෙන් ඒවා දිරාපත් වීමට කාලයක් ගත වන නිසා, ට්‍රැක්ටර් භාවිතයේ දී ප්‍රශ්න ඇති වීමත්, රසායනික පොහොර භාවිතයෙන් තරම් ඉක්මනින් ඉහළ ඵලදාවක් ලබාගත නො හැකි වීමත් නිසා ඇතැම් ගොවීහු කාබනික පොහොර යෙදීමට මැළිකමක් දක්වති.

ගොවීන්ට ණය පහසුකම් ලබා ගැනීම සඳහා පිහිටුවන ලද රාජ්‍ය බැංකු මේ වන විට ව්‍යාපාරිකයන්ට ණය ලබාදෙන ආයතන බවට පත්ව ඇති අතර ගොවීන්ගේ අදහසට අනුව ගොවිජන බැංකු ක්‍රමය ද ඵලදායි බවින් අඩු ය. එසේ ම මහා වාරිමාර්ගවල ගොවීන්ට රජයෙන් ලබාදෙන සක්‍රීය ණය මුදල ප්‍රමාණවත් නොවේ. මේ ගැටළුවලට පිළියම් ලෙස ගොවීන් මගින් ක්‍රියාත්මක වන වඩා කාර්යක්ෂම වූ බැංකු ක්‍රමයක් හඳුන්වා දීමත්, රජයේ අනුග්‍රහය ලබා දීමත්, ගොවීන් හා බැංකු අතර මනා සම්බන්ධතාවයක් ඇති කිරීමත් අවශ්‍ය බව ගොවි මහතුන්ගේ අදහස යි. එසේ වුව ද මෙහි දැක්වූ බැංකු මගින් ගොවීන් කෘෂිකාර්මික කටයුතු සඳහා ලබා ගන්නා ණය මුදල් නැවත ගෙවීම පිළිබඳ ඔවුන් දරන ආකල්පය එතරම් යහපත් නො වන බැව් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් ගොවි ණය හා සම්බන්ධව මින් පෙර කර ඇති අධ්‍යයනයක් මගින් අනාවරණය විය (Rural Credit for Small Farming Sector: Achievements Failures and Future Prospects, 2005). මේ නිසා ම එම බැංකු, ගොවීන් සඳහා ඊ ළඟ වතාවේ ණය ලබාදීමට මැළි වෙති. එසේ ම ගොවීන්ට ලබා දෙන කෘෂි රක්ෂණ ආවරණය නිසි කලට ලබා දීම අත්‍යවශ්‍ය වන අතර, එය එසේ නො වීම බලවත් ප්‍රශ්නයක් බව ඔවුන්ගේ අදහස විය. ව්‍යාප්ති සේවාවන් දුර්වල මට්ටමක පැවතීම පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවලින් එළිදැක්වෙන නව සොයා ගැනීම් වගා බිම් කරා ගෙනයාමට බාධාවක් වේ. ගම් මට්ටමින් කෘෂි ව්‍යාප්ති කාර්යාල ඉවත් කිරීම නිසා කෘෂි පර්යේෂකයන් හා ගොවියන් අතර ඵලදායි ලෙස තොරතුරු ගලා යාමට බාධා පැමිණ තිබේ (මහ බැංකු වාර්තාව, 2005). ගොවීන් හා පර්යේෂකයින් අතර ඇති හිඩැස නිසා පර්යේෂණවල නව සොයා ගැනීම් සහ තාක්ෂණික ශිල්පීය ක්‍රම උපයෝගී කරගැනීමේ අවස්ථාව අඩුවීමෙන් මෙම අංශයේ ඵලදායිතාව නැංවීමේ අවස්ථා වැළකී ඇත.

මුහුදින් වැටෙන එක් දිය බිඳුවකුදු ප්‍රයෝජනයට නො ගෙන මුහුදට ගලා යෑම අපරාධයක් බව එදා රජ දරුවෝ සැලකූහ. ඒ නිසා මහා වාරිමාර්ග නිර්මාණය විය. ජල කළමනාකරණය එහි දී ප්‍රධාන

වශයෙන් අවධානයට ලක් වූවක් විය. බොහෝ රටවල ජල අර්බුදයක් පවතින තත්ත්වයක් හමුවේ දේශීය ගොවීන්ට නොමිලේ ලබාදෙන මෙම ජලය අපතේ යෑමට ලක්වීම සිදු නො කළ යුත්තකි. එසේ ම ජල කළමනාකරණ තීරණ ගැනීමේ දී ගොවි මහතුන්ගේ අදහස් ලබා ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීමත්, විනාශ වී ගිය ඇළ වේලි, වැව් තාවුලු ප්‍රතිසංස්කරණය කිරීමත් අත්‍යවශ්‍ය වේ. රොන්මඩ ගලා විත් වැව්වල පතුලේ තැන්පත් වී ජලාශවල ධාරිතාව අඩුවීමත්, රසායනික පොහොර අධික ලෙස භාවිතය නිසා ජලාශ සුපෝෂණය වීමට ලක්වීමත් බොහෝ වාරිමාර්ග ප්‍රදේශවල ගැටළුවක් ව පවතී. සාම්ප්‍රදායික පරිසරයක් තුළ දී ගොවි ජනතාව විසින් ම වාර්ෂිකව වාරිමාර්ග නඩත්තු කරගැනීම සඳහා ඔවුන්ට අවශ්‍ය පස් රොන් මඩ ඉවත් කිරීමෙන් ලබා ගත් අතර එමගින් වාර්ෂිකව රොන් මඩ තැන්පත් වීම සඳහා අවකාශ වැව තුළ ම නිර්මාණය විය. මෙම කුඩා වලවල් "කට්ටි වලවල්" නම් වූ අතර මේ නිසා අස්වැන්න කපා පාගා ගැනීමෙන් අනතුරුව එළඹෙන නියං සමයේ දී වුවද, අඩි 4-5 දක්වා වූ ජල ප්‍රමාණයක් වැව තුළම රඳවා ගැනීමට හැකි විය. නමුත් මේ වන විට ජලාශවල රොන්මඩ ඉවත් කිරීම විශාල ප්‍රශ්නයක්ව පවතී. ඒ සඳහා පිළියමක් ලෙස රොන් මඩවලින් වැලි නිෂ්පාදනය කිරීමට ගොවීන් යෝජනා කළ ද මෙහි යම් යම් තාක්ෂණික ගැටළු ඇත. වැව්වල පතුලේ ඇති තද පස් ස්ථරවලට හානි සිදුවීමේ ප්‍රවණතාවයක් මෙහි දී ඇති වේ. එම නිසා භූ ගත ජල මට්ටම අඩුවීමට ඉඩ ඇති බැවින් සුදුසු තාක්ෂණික සහාය යටතේ රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය (public private partnership) මත මෙය සිදු කිරීම වඩා උචිත වේ. එසේ ම සෑම වැවක ම මිරිදිය ධීවර කර්මාන්තය ඇති කිරීමට පියවර ගැනීමත් තුළින් අතිරේක ආදායමක් ලබා ගැනීමට ද මං පෑදේ.

වර්තමානයේ ගොවීන් මුහුණ පා ඇති තවත් ප්‍රධාන අභියෝගයක් වනුයේ අලෙවිකරණ හා ගබඩාකරණ ගැටළුව යි. කෘෂි භෝගවල ඉක්මනින් නරක්වන සුළු ස්වාභාවය නිසා එළවළු ගොවීන් වර්තමානයේ දැඩි ගැටළුවකට මුහුණ දී ඇත. බොහෝ ප්‍රදේශවල එක්වර අස්වනු නෙළීම නිසා මිල පහළ යාමෙන් ගොවීන් වඩා අසරණ වේ. එම තත්ත්වය මග හරවා ගැනීමට නම් කාලානුරූපව වගා අස්වනු නෙළා ගැනීමට ගොවීන් දැනුවත් කළ යුතු ය. මේ සඳහා සියළුම ප්‍රදේශවල එකවර භෝග වගා කිරීම සීමා නො කළ යුතු අතර, භෝග විවිධාංගී-කරණය, අස්වනු කල් තබා ගැනීමේ නූතන තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම, අස්වනු වෙළෙඳ පොළට එන කාලයට ආනයන සීමා කිරීම සඳහා රජය පියවර ගැනීම අවශ්‍ය වේ.

රටක් සංවර්ධනය වීමේ දී එරට මුහුණ දෙන ප්‍රධාන අභියෝගය වන්නේ දේශීය ගොවි ආර්ථිකය කඩා වැටීමට ලක් නොවී පවත්වා ගැනීම ය. එම නිසා කෘෂිකර්මය වර්තමාන වෙළෙඳ ආර්ථිකයට ගැළපෙන පරිදි කෘෂි ව්‍යාපාරයක් බවට පත් කිරීමත්, දේශීය ගොවියා වඩා ශක්තිමත් වූ ගොවි ව්‍යාපාරිකයකු බවට පත් කිරීමත් අවශ්‍යයෙන් ම සිදුවිය යුත්තකි. මෙහි දී ගොවියාගේ ආදායම ඉහළ නංවා, වියදම අවම කර, ප්‍රතිලාභය ඉහළ නැංවීම අවශ්‍ය වේ. කාර්යක්ෂම භාණ්ඩ නිෂ්පාදනය, භාණ්ඩ අලෙවිය, තාක්ෂණික සේවා අප රටට ගැළපෙන පරිදි යොදා ගැනීම මෙහි ලා වැදගත් වේ. පශ්චාත් අස්වනු හානිය අවම කිරීමට පියවර ගැනීම, ඉල්ලුම මත පදනම් වූ කෘෂි ව්‍යාප්ති සේවයක් හඳුන්වා දීම, ගොවිපල යෙදවුම් වඩාත් කාර්යක්ෂමව භාවිතා කිරීම ආදිය මගින් තිරසාර කෘෂිකාර්මික වර්ධනයක් ළඟා කර ගත හැක. මේ සඳහා ඵලදායිත්වය හා තරගකාරිත්වය ඉහළ නැංවෙන කෘෂි ප්‍රතිපත්තියක් අවශ්‍ය වේ.

එසේ ම, ගොවි සංවිධානවල ව්‍යුහයේ පවතින දුර්වලතා, කෘෂිකාර්මික යෙදවුම්, වගා ණය, ජල කළමනාකරණය හා අලෙවිකරණය පිළිබඳ, ගොවි සංවිධාන නියෝජිතයන් දක්වන ලද ඉහත සඳහන් අදහස් හා ඔවුන්ගේ යෝජනා ද මෙහි දී සැලකිල්ලට ගැනීම ව්‍යාපාරික ගොවි පංතියක් බිහිවීමට අවශ්‍ය පසුබිමක් සකස් කරනු'යි සිතමි. එම නිසා ලෝක ආහාර අර්බුදය හමුවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය පිළිබඳවත් ආහාර සුරක්ෂිතතාව පිළිබඳවත් අවධානයක් යොමු වී ඇති මෙම වකවානුවේ ගොවි ගැටළුවලට විසඳුම් ලබාදීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට පියවර ගත යුතු ව ඇත.

**එම්.ඩබ්.ඒ.සී.එස්. විජේතුංග**
පර්යේෂණ නිලධාරිණී
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.